// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2076/4 - 2018 ජුනි මස 18 වැනි සඳුදා - 2018.06.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත

1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 20 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය.

2018 ජුනි මස 18 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

මෙම නියෝග 2018 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(I) 2017 නොවැම්බර් මස 09 වැනි දිනැති අංක 2044/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද විශේෂ ආනයන බලපත්‍ර නියෝගයන් හි අංක IV දරන උපලේඛනයෙන් මෙහි පහත සඳහන් I සහ II වන තීරයේ දැක්වෙන, අයිතමයේ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ III වන තීරයේ දැක්වෙන, ඊට අනුරූපී සටහන් මෙයින් ඉවත් කරනු ලැබේ.

| *(I) තීරය* <br> *ශීර්ෂ* <br> *අංකය* | *(II) තීරය* <br> *සංයෝජිත වර්ගීකරණ* <br> *සංකේතාංකය* | | *(III) තීරය* <br> <br> *විස්තරය* | *තහනම* |
|---|---|---|---|---|
| 38.08 | 3808.93.90 | --- | ග්ලයිෆොසේට් | B |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(II) 2017 නොවැම්බර් මස 09 වැනි දිනැති අංක 2044/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද විශේෂ ආනයන බලපත්‍ර නියෝගයන් හි අංක I දරන උපලේඛනයට මෙහි පහත සඳහන් I සහ II වන තීරයේ දැක්වෙන, අයිතමයේ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ III වන තීරයේ දැක්වෙන, ඊට අනුරූපී සටහන් මෙයින් ඇතුලත් කරනු ලැබේ.

| *(I) තීරය ශීර්ෂ අංකය* | *(II) තීරය සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය* | | *(III) තීරය විස්තරය* | *ICL* |
|---|---|---|---|---|
| 38.08 | 3808.93.90 | --- | ග්ලයිෆොසේට් | L |

(III) මෙම රෙගුලාසීන් ප්‍රකාශයට පත් කළ දින සිට මාස 36ක් සඳහා පමණක් වලංගු වන අතර මාස 36ක් කල් පිරීමෙන් පසු නැවතත් 2017 නොවැම්බර් මස 09 වන දිනැති 2044/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* රෙගුලාසිවලට යටත් වේ.

07 - 67

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.